සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved]

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

# ගම්පහ අධ්‍යාපන කලාපය
# Gampaha Education Zone

## දෙවන වාර ඇගයීම - 2025
## Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade } 11 | විෂයය Subject } පුරවැසි අධ්‍යාපනය II Civic Education II | කාලය Time } පැය 02යි 02 hours |

නම :- .................................................................... ශ්‍රේණිය :- ..........................................

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01. (i) ග්‍රීසියේ පැවති පෞර රාජ්‍ය දෙකක් නම් කරන්න.
(ii) දේශපාලන අයිතිවාසිකම් දෙකක් ලියන්න.
(iii) සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා ගුණාංග දෙකක් ලියන්න.
(iv) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපෑ සාධක දෙකක් ලියන්න.
(v) පූර්ණ පුද්ගල හා සමාජ සංවර්ධන සංකල්පයේදී සලකා බැලිය යුතු සංවර්ධන අංශ දෙකක් ලියන්න.
(vi) සමාජයක ගැටුම් ඇතිවීමට බලපාන මූල දෙකක් ලියන්න.
(vii) අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති ප්‍රතිපාදන දෙකක් ලියන්න.
(viii) වර්තමාන ලංකාවේ දේශපාලන ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් ලියන්න.
(ix) අයිතිවාසිකම හා බැඳුණු පුරවැසි යුතුකම් වර්ග කර ඇති ආකාර දෙක ලියන්න.
(x) එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සැකසීමේදී පදනම් කරගත් විශේෂ අරමුණු දෙකක් ලියන්න. (2 × 10 = 20)

02. (i) ලෝකයේ දක්නට ලැබෙන පක්ෂ ක්‍රම දෙකක් ලියන්න. (ල. 2)
(ii) නිදහස් හා සාධාරණ මැතිවරණයක තිබිය යුතු ලක්ෂණ තුනක් ලියන්න. (ල. 3)
(iii) (අ) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට අවශ්‍ය සාධක තුනක් ලියන්න.
(ආ) ඉන් එක් සාධකයක් එය සාර්ථක වීමට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල. 5)

03. (i) යහපාලනයක් ක්‍රියාත්මක වන සමාජයක පවතින මූලික ගුණාංග දෙකක් ලියන්න. (ල. 2)
(ii) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ තුනක් ලියන්න. (ල. 3)
(iii) (අ) පුද්ගලයන් තුළ ඇතිවන ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීමේ වාසි තුනක් ලියන්න.
(ආ) ඉන් එකක් ක්‍රියාත්මක කිරීමෙන් ඇතිවන ප්‍රතිලාභ විස්තර කරන්න. (ල. 5)

04. (i) වර්තමානයේ ක්‍රියාත්මක වන නව ලිබරල්වාදී වෙළඳපොළ ආර්ථික ක්‍රමයේ මූලික ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 2)

(ii) පරිවර්තන ආර්ථිකයක මූලික ලක්ෂණ තුනක් ලියන්න. (ල. 3)

(iii) (අ) ගෝලීයකරණයට මුහුණදීමට ලෝකයේ විවිධ රටවල් එකතු වී පිහිටුවාගත් සංවිධාන තුනක් ලියන්න.

(ආ) ගෝලීයකරණය නිසා ලංකාවට ඇතිවී තිබෙන වාසියක් පැහැදිලි කරන්න. (ල. 5)

05. (i) රීට් ආඥා නිකුත් කළ හැකි අධිකරණ ආයතන දෙකක් ලියන්න. (ල. 2)

(ii) මහේස්ත්‍රාත් අධිකරණය සතු අධිකරණ බලතල තුනක් ලියන්න. (ල. 3)

(iii) (අ) ආරවුල් විසඳීමට විකල්ප ක්‍රම තුනක් ලියන්න.

(ආ) ඉන් එක් ක්‍රමයක් ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න. (ල. 5)

06. (i) 1972 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 2)

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක බලතල තුනක් ලියන්න. (ල. 3)

(iii) (අ) ලංකාවේ ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට හේතු වූ කරුණු තුනක් ලියන්න.

(ආ) ඉන් එක් හේතුවක් සාර්ථක වන ආකාරය පැහැදිලි කරන්න. (ල. 5)

07. (i) මානව අයිතිවාසිකම් වර්ග කරන ආකාර දෙක ලියා දකවන්න. (ල. 2)

(ii) ලංකාවේ මූලික අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ල. 3)

(iii) (අ) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් ලියන්න.

(ආ) ඉන් එකක් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ල. 5)